**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය - 2020**

---------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ රු.106,294,775 ක් විටිනා අයිතම 69 ක් සම්බන්ධයෙන් අවසන් ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 වගන්ති අංක 40 අනුව ආයතනයකට ස්ථාවර වත්කම් වාර්තා කිරීම සඳහා ක්‍රම දෙකක් යෝජනා කර ඇත. ඒ අනුව මෙම අධිකාරිය තෝරාගෙන ඇත්තේ පිරිවැය ක්‍රමයයි. (Cost Model) ඒ අනුව 47 වගන්තියේ ප්‍රතිපාදන මෙම අධිකාරිය සඳහා අදාල නොවේ. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පරමාණුක අවශෝෂණ දීප්තමානය සඳහා 2019 දෙසැම්බර් 26 දින දරන ලද රු. 1,215,299 ක අලුත්වැඩියා වියදම සහ 2018 වර්ෂයේ දරන ලද රු.1,836,626 ක වාහන අලුත්වැඩියා වියදම අත්පත් කරගැනීමක් ලෙස සලකා ප්‍රාග්ධනිත කර තිබීමේ වරද | 2021 වර්ෂයේ ගිණුම් මඟින් ගැලපීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදිව ගැලපුම් සිදුකිරීමට කටයුතු කල යුතුය. |

සමාලෝචිත වර්ෂයේදීද මූල්‍ය ප්‍රකාශනවල නැවත ගැලපීමට කටයුතු කර නොතිබුණි.

### 1.5.3 අවිනිශ්චිත ගිණුම්

| විෂය | මුදල | අවිනිශ්චිත ලෙස තිබූ කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ ණයහිමියන් විසින් සෘජුවම බැංකුවට බැරකරන ලද රු.265,165 ක් අවිනිශ්චිත ගිණුම් ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 265,165 | වර්ෂ 01 | මෙම බැරකම් නියමිත පරිදි හඳුනා ගැනීමට හැකි සෑම උත්සාහයක් දැරුවද අනන්‍යතාවය හඳුනා ගැනීමට නොහැකි විය. එම හඳුනා ගැනීමට නොහැකි බැර වීම හඳුනා නොගත් ලැබීම් ලෙස ගිණුම් වල පෙන්වා ඇත. | සෘජුවම බැංකුවට බැරකරන ලද මුදල් හඳුනාගැනීමට කටයුතු කල යුතුය. |

## 1.6 සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් නොකිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ද්විතීක පදනම මත සේවයට නිදහස් කර ඇති සාමාන්‍යාධිකාරීවරයාගේ ස්ථිර සේවා ස්ථානය වූ රුහුණු විශ්ව විද්‍යාලය සමඟ ගිවිසුම්වලට එළඹීම හෙළිදරව් කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් හඳුන්වා දී ක්‍රියාත්මක කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් | රසායනාගාරයට අදාල යන්ත්‍ර නිෂ්කාර්යව පැවතුණද ඒ | රසායනාගාරයට අදාළ යන්ත්‍ර කාර්යක්ෂමව හා එලදායි ලෙස | වත්කම් සම්බන්ධයෙන් පසු විපරම් කිරීම අඛණ්ඩව සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 802(1),(2),(3) | සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉදිරියේදී ක්‍රියාවේ යෙදවීමට දැනටමත් අදාළ කළමනාකරුවන්ට දැනුම් දී ඇත. | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතක සංග්‍රහයේ VI වැනි පරිච්ඡේදයේ 02 වන වගන්තිය | සියළුම නිලධාරීන් සම්බන්ධයෙන් චර්යා සටහන් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. | මෙතෙක් එක් එක් නිළධාරියා සඳහා වෙනම චර්යා සටහන් පත්‍රයක් පවත්වා ගෙන ගොස් නොමැති අතර විගණනයේදී පෙන්වා දුන් පරිදි මෙම වර්ෂයේ සිට මෙය නිවැරදි කර අධිකාරියේ සියලුම නිළධාරින් සඳහා චර්යා සටහන් පත්‍රයක් පවත්වා ගෙන යාමට කටයුතු කරනු ලැබේ. | ආයතන සංග්‍රහයේ විධි විධාන අනුව කටයුතු කල යුතුය. |
| **(ඇ)** | **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | | | |
| | i. 5.4.6 ඡේදය | ගාල්ල, දඩල්ල කාර්යාල ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ඉදිකිරීමේ දෝෂ හඳුනාගැනීම හා දෝෂ නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | ගාල්ල කාර්යාල සංකීර්ණය තුළ පවතින ඉදිකිරීමේ දෝෂ සම්බන්ධයෙන් දැනටමත් මධ්‍යම ඉංජිනේරු පර්යේෂණ කාර්යාංශයට දැනුම් දී ඇත. එසේ හඳුනාගත් ඉදිකිරීමේ දෝෂ මෙම ආයතනය විසින් නිවැරදි නොකරන්නේ නම්, රැඳවුම් මුදල් වලින් නිවැරදි කර ගැනීමට කළමනාකාරීත්වය දැනටමත් තීරණය කර ඇත. | වගකීම් කාලය තුල දෝෂ හඳුනාගැනීම හා නිවැරදි කිරීම් ක්‍රමවේද කාර්යක්ෂමව ක්‍රියාත්මක කළ යුතුය. |
| | ii. 8.12.1 ඡේදය | භාරගැනීමට පෙර ඉටුකර ඇති සේවාවල ගුණාත්මක | ගාල්ල කාර්යාල සංකීර්ණය සැලසුම් කිරීම, ඉදිකිරීම් | ඉදිකිරීම් ගොඩනැගිල්ල භාරගැනීමට පෙර පරීක්ෂාකර බලා නිවැරදි |

| | | | | |
|---|---|---|---|---|
| | | භාවය ස්වාධීනව පරීක්ෂා කළ යුතු වුවද ගාල්ල දඩල්ල ගොඩනැගිල්ල සම්බන්ධයෙන් එවැනි පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | කටයුතු මධ්‍යම ඉංජිනේරු පර්යේෂණ කාර්යාංශය විසින් සිදුකරන ලද බැවින් සහ මෙම ආයතනය රාජ්‍ය ආයතනයක් වන බැවින් ගොඩනැගිල්ල භාරගැනීමේදි අමතර මුදලක් වැයකර ඉටුකර ඇති සේවා වල ගුණාත්මකභාවය පරීක්ෂාවට භාජනය නොකරන ලදී. | බවට තහවුරු කර ගැනීමෙන් පසුව භාරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2016 දෙසැම්බර් 06 දිනැති අංක 1996/27 දරන සමුද්‍රීය පරිසර ආරක්ෂණ අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් නියෝගයේ II වැනි උපලේඛනයේ 17(ඌ) වගන්තිය | දැව්තෙල් අපද්‍රව්‍ය කාණ්ඩය යටතේ ලියාපදිංචි වන සියළුම සේවා සපයන්නන් විසින් මූලික තැන්පතුව ලෙස රුපියල් ලක්ෂ 03 ක් තැබිය යුතු වුවද ඉන් බැහැරව ආයතන 03 කට අදාල බලපත්‍ර නිකුත් කර තිබුණි. | විගණනයේ පෙන්වා දී ඇති පරිදි අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් නියෝගයේ II වැනි උපලේඛනයේ 17 (ඌ) වගන්තිය ප්‍රකාරව රු.300,000 ක මූලික තැන්පතුව තැන්පත් නොකරන සේවා සැපයුම්කරුවන් අධිකාරියේ අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ සේවය සඳහා ලියාපදිංචි කර නොගන්නා බව කාරුණිකව දන්වා සිටිමි. | නෛතික අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කළ යුතුය . |
| (ඈ) | 2020 ඔක්තෝම්බර් 26 දිනැති අංක 02/2020 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | | | |
| | i. 2(ii) ඡේදය | අධිකාරියේ සියලුම තනතුරු සඳහා වූ බඳවා ගැනීමේ පටිපාටිය පිළියෙල කොට අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | 02/2016 චක්‍රලේඛය අනුව අධිකාරියේ සියලුම තනතුරු සඳහා බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පරිපාටිය සකස් කිරීම මේ වන විට සිදු කරමින් පවතී. ඒ | බඳවාගැනීමේ පරිපාටිය පිළියෙල කර අනුමැතිය ලබාගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අනුව ඉදිරි මාසය ඇතුලත එම පටිපාටිය සකස් කර නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කිරීමට අපේක්ෂා කරමි. | |
| ii. 2(vi) ඡේදය | අනුප්‍රාප්තික සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 02/2016 චක්‍රලේඛයට අනුව බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටියට සමගාමීව පුරප්පාඩු පිරවීම සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | අනුප්‍රාප්තික සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 50,000,017 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 2,952,703 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 47,047,314 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට 2020 වර්ෂයේ නෞකාවක් මගින් ඇති වූ සමුද්‍රීය දූෂණ කටයුත්තක් වෙනුවෙන් වූ නෛතික ක්‍රියාවලිය මගින් අයකර ගන්නා ලද ආදායම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වටිනාකම රු.1,182,000 ක්වූ ඩිංගි බොට්ටුවක් හා බොට්ටු එන්ජිමක් 2016 වර්ෂයේ පෙබරවාරි මාසයේ සිට නිෂ්කාර්යව පවතින අතර විවිධ වැඩසටහන් සඳහා අවශ්‍ය බෝට්ටු කුලී පදනම මත ලබා ගෙන තිබුණි. | ඉදිරියේදී අධිකාරියේ වැඩසටහන් සඳහා භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කිරීමට කළමනාකාරීත්වයට උපදෙස් ලබාදෙනු ලැබේ. | වත්කම්වල උපරිම ඵලදායීතාවය ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2016 දෙසැම්බර් 29 දින මිලදී ගන්නා ලද රු.5,800,000 ක් වටිනා පරමාණුක අවශෝෂණ වර්ණාවලි දීප්තමානය 2016 වර්ෂයේ මිලට ගත් දින සිට නිශ්ක්‍රීයව පැවතුණි. | අළුත්වැඩියා කර ගාල්ල රසායනාගාරය වෙත ලබාදී ඇති අතර අළුත්වැඩියාවෙන් පසු භාවිතයට ගත හැකි ආකාරයට මෙම යන්ත්‍රය සවිකර දී නොමැත. | වත්කම්වල උපරිම ඵලදායීතාවය ලබා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) සමුද්‍රීය පරිසර ආරක්ෂණ සේවාවන් වාණිජ මට්ටමින් ලබාදීමේ අරමුණින් රුපියල් මිලියන 66.6 ක් වැය කරමින් 2017 වර්ෂයේදී ගාල්ල දඩල්ල වෙරළාසන්න භූමියක ඉදිකර තිබූ රසායනාගාරය සඳහා රු.මිලියන 54.2 ක් වටිනා උපකරණ මිලදී ගෙන තිබුණි. විගණිත දින වන විට මෙම උපකරණ භාවිතා කරමින් සීමිත රසායනාගාර පරීක්ෂාවන් ප්‍රමාණයක් පමණක් සිදු කර තිබුණි. එසේම රසායනාගරයේ මෙහෙයුම් කටයුතු වාණිජ මට්ටමින් පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. තවද කල් ඉකුත් වූ රසායන ද්‍රව්‍යයන් පරිසර හිතකාමී ලෙස බැහැර කිරීමට කටයුතු කර නොතිබුණි. | පුහුණු නිලධාරීන් බඳවාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවති. වාණිජ මට්ටමේ සේවයක් ලබාදීමට අවශ්‍ය මාර්ගෝපදේශ යාවත්කාලීන කිරීමට කටයුතු සිදුකරනු ලැබේ. | වත්කම්වල උපරිම ඵලදායීතාවය ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

**3.2 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්**

---------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියට අයත් රු.මිලියන 6.8 වටිනා inflatable oil boom යන්ත්‍රය ඇමරිකානු ඩොලර් 50 ක දෛනික වටිනාකමට 2020 අප්‍රේල් 01 දින සිට අගෝස්තු 13 දින දක්වා හම්බන්තොට අන්තර්ජාතික වරාය සමාගමට කුලියට ලබාදී තිබුණි. මෙම යන්ත්‍රය කුලියට දීමට අදාලව 2020 පෙබරවාරි 07 දිනැති අංක 06/MEPA/OSCP/HIPG/2020 ලිපියෙහි හම්බන්තොට අන්තර්ජාතික වරාය සමාගමට අදාලව රු. මිලියන 5 | 2020 අප්‍රේල් 01 වන දින සිට අගෝස්තු 13 දක්වා කාලය තුළ හම්බන්තොට අන්තර්ජාතික වරාය සමාගමට කුලී පදනම මත මෙම inflatable oil boom යන්ත්‍රය ලබාදෙන ලදී. මෙම කාලය තුළ රු. මිලියන 1.2 ක ආදායමක් අධිකාරියට හිමිවිය. මෙම කාලය තුළ රටේ පැවති වසංගත තත්වය මත බැංකු ඇපකරයක් එම සමාගමෙන් | වත්කම් සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ක් වටිනාකමැති බැංකු අණකරයක් සඳහන් කර තිබුණද මෙම යන්ත්‍රය කුලියට දීමට අදාලව 2020 පෙබරවාරි 20 දිනැති අංක 06/MEPA/OSCP/HIPG/2020 දරන, ආයතනයට යොමු කරන ලද මිල කැඳවුමෙහි සඳහන් බැංකු අණකරයේ වටිනාකම රු.මිලියන 02 කි. නමුත් අධිකාරිය විසින් ඉහත ආයතනය සඳහා මෙම යන්ත්‍රය කුලියට දීමේදී බැංකු අණකරයක් ද ලබා ගෙන නොතිබුණි. | ලබාගැනීමට අපහසු විය. නමුත් මෙම inflatable oil boom යන්ත්‍රය ලබාදුන් තත්වයෙන්ම අධිකාරියට නැවත ලැබීම හේතුව මත බැංකු ඇපකරයක අවශ්‍යතාවය ඇති නොවීය. | |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත තනතුරු සංඛ්‍යාව 229 ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 174 ක් වූ අතර ඒ අනුව පුරප්පාඩු සේවක සංඛ්‍යාව 54 ක් විය. මෙම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට විගණිත දින වන විටත් කටයුතු කර නොතිබුණි. | අධිකාරිය විසින් සමුද්‍ර පරිසර නිලධාරීන්, සහකාර සමුද්‍ර පරිසර නිලධාරීන් සහ කළමනාකරණ සහකාරවරුන් බඳවාගැනීම සඳහා දැනටමත් පුවත්පත් දැන්වීම් පළකර ඇති අතර, සහකාර සමුද්‍ර පරිසර නිලධාරීන් බඳවාගැනීම් සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් කර ඇත. සමුද්‍ර පරිසර නිලධාරීන් සහ කළමනාකරණ සහකාරවරුන් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ අතර, covid - 19 වසංගත තත්වය හේතුව මත අවසන් සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නොහැකි විය. | පුරප්පාඩුව පිරවීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 සහ 2019 වර්ෂවලට අදාල අධිකාරියේ වාර්ෂික වාර්තා සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2017 හා 2018 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | වාර්ෂික වාර්තා නියමිත කාලය තුළ සභාගත කිරීමට කටයුතු කළයුතු වේ. |

**4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ක්‍රියාකාරි සැලැස්මට අනුව ව්‍යාපෘති 07 කට රු.6,670,000 ක් ඇස්තමේන්තු කර තිබූ අතර එහි වියදම රු.8,594,846 ක් විය. ඒ අනුව රු.1,924,846 ක් ඇස්තමේන්තුව ඉක්මවා වැයකර තිබූ අතර එහි ප්‍රතිශතය සියයට 29 ක් විය. | වැඩිපුර වියදම් වීම් වලට වඩා වැඩි මුදලක් අධිකාරිය විසින් ප්‍රදාන හා වියදම් ප්‍රතිපූර්ණය කරගැනීම් ලෙස ලබාගෙන ඇත. | ඇස්තමේන්තු කළ අදාල වියදම කළමනාකරණය කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) ක්‍රියාකාරි සැලැස්ම අනුව ප්‍රධාන ව්‍යාපෘති 08 ට අදාල උප අංශ 09 ක මුළු ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.8,381,000 ක් වූ අතර ඉන් උපයෝජනය නොකළ ප්‍රමාණය රු.6,935,050 ක් විය. ඒවායේ ප්‍රතිශතය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 68 සිට සියයට 97 දක්වා වූ පරාසයක විහිදී තිබූ බව නිරීක්ෂණය විය. | වියදම් නොදැරීමට හා ක්‍රියාකාරකම් 2021 වර්ෂය දක්වා ඉදිරියට රැගෙන යාමට අදාල කරුණු පැහැදිලි කිරීම් දක්වා ඇත. | ක්‍රියාකාරි සැලැස්ම තුළ අඩංගු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

**4.3 පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ (6) (ඇ) වගන්තිය හා 2013 ජුනි 28 දිනැති අංක 37/1816 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව අපද්‍රව්‍ය පරීක්ෂා කර තහවුරු කර ගැනීමකින් තොරව සාගරයට බැහැර කිරීම වැලැක්වීමට අධිකාරිය කටයුතු කළයුතු වුවද අන්තරාකාරී ද්‍රව්‍ය වන සායනික අපද්‍රව්‍ය දිගු නල මගින් සාගරයට සෘජුව බැහැර කිරීම වැලැක්වීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි. | මෙම දිගු නළ මගින් කොළඹ අපජලය පද්ධතියේ අපද්‍රව්‍ය වලට අමතරව බවුසර් රථ මගින්ද කර්මාන්තශාලා, නිවාස හා අනෙකුත් ස්ථාන වල ජනනය වන අපජලය පිරිපහදු කිරීමකින් තොරව සාගරයට මුදා හරියි. මේ සඳහා කොළඹ මහ නගර සභාව සහ ජල සම්පාදන මණ්ඩලය සමග රැස්වීම් වාර ගණනක් පැවැත්වූ අතර, එම ආයතන ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග මේ වන තෙක් ගෙන නොමැත. මෙම කරුණ ජනාධිපති ලේකම් කාර්යාලය, ආරක්ෂක අමාත්‍යංශය, බස්නාහිර පළාත් ආණ්ඩුකාර | අන්තරායකාරි අපද්‍රව්‍ය වන රසායනික අපද්‍රව්‍ය දිගුනල මගින් සාගරයට සෘජුව බැහැර කිරීම වැලැක්වීමට අධිකාරිය කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ලේකම් කාර්යාලය වැනි ආයතන වෙත යොමු කර ඇති අතර, මේ සඳහා ක්‍රියාමාර්ග ගතයුතු රාජ්‍ය ආයතන වලින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැති නිසා පනත අනුව ක්‍රියාකිරීමට අධිකාරියට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇත. | |

**4.4 තිරසාර සංවර්ධන අරමුණු**

-----------------------------

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අධිකාරිය විසින් 2025 වර්ෂය වන විට තිරසර සංවර්ධන අරමුණු අංක 14 යටතේ ප්‍රධාන ඉලක්ක 05 ක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ හඳුනාගෙන තිබුණි. මේ අතරින් දෛනිකව කොරල්පර පවිත්‍ර කිරීම, කොරල්පර ප්‍රතිෂ්ඨාපනය, කඩොලාන ප්‍රතිෂ්ඨාපනය හා කඩොලාන වගා කිරීම යන ප්‍රධාන ඉලක්කවල කාර්යසාධනය පරීක්ෂාවේදී වර්ෂ 2025 වන විට අපේක්ෂිත ඉලක්ක ළඟාකර තැනීම සඳහා ක්‍රියාත්මක වීමේ කාර්යක්ෂමතාවය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය. | කොරල්පර ප්‍රමාණය ප්‍රතිස්ථාපනය කිරීමට කටයුතු කරන බව දන්වමි. ඒ අනුව අපේක්ෂිත සංරක්ෂණ තත්වය කරා ලඟා වනු ඇත.<br>වගා භූමි හඳුනාගැනීම මේ වන විටත් සිදුකරමින් පවතින අතර, පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින්, පරිසර අමාත්‍යාංශය සහ Slycan Trust ආයතනය සමග එක්ව මෙම කඩොලාන නැවත වගාවන් සිදුකිරීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. | සැලසුම් ක්‍රියාත්මක විමේ ප්‍රගතිය සමාලෝචනය කළ යුතුය. |